සන්නස
SANNASA

# ආ මග සටහන්

දයාරත්න වීරසේකර
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික,
නියෝජ්‍ය විභාග කොමසාරිස්

මතුගම සී.ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මධ්‍ය විද්‍යාලයය ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමයේ මුලාරම්භය සනිටුහන් කළ විදුහල් කිහිපයෙන් එකකි. දහනවවන ශත වර්ෂය අගදී ස්වභාෂා පාසලක් වශයෙන් ආරම්භකර, පසුව රජයේ ද්විභාෂා පාසලක් වශයෙන් වර්ධනය වූ එම කුඩා විදුහල, 1941 වසරේදී මධ්‍ය විද්‍යාලයයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලදී. කන්නන්ගර ඇමතිතුමාගේ නිදහස් අධ්‍යාපන පනත සම්මත වීමෙන් පසුව, දිවයිනේ ප්‍රදේශ කිහිපයක ආරම්භ කරන ලද මුල්ම මධ්‍ය විද්‍යාල පහෙන් එකක් මතුගම මධ්‍ය විද්‍යාලයය විය.

ප්‍රවීණතාවක් ඇති උන්වහන්සේ, මහා පඬි රුවණක්ම විය. උන්වහන්සේ ඉංග්‍රීසි යන වචනය වැරදි බව අපට බොහෝ විට පවසා ඇත. ඒ සඳහා නිවැරදි සිංහල උච්චාරණය "ඉන්ග්ලිශ්" බව නිතර අවධාරණය කළහ. සිංහල සාහිත්‍ය යේ සමහර යෙදුම්, උපහාසය, එළිසමය වැනි දේ බටහිර සාහිත්‍යයේ, ශේක්ස්පියර්, ඩිකන්ස් වැනි ලේඛකයින්ගේ යෙදුම් සමග සංසන්දනය කර රසාස්වාදන වින්දනය සඳහාත්, උන්වහන්සේ අප නිතර යොමු කිරීමට, උත්සාහ ගත්හ.

ස්වාමින්වහන්සේගේ දක්ෂ ඉගැන්වීම

## සාහිත්‍ය පාඩමක් සහ ඉණපටියක්

එතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආසනය වන මතුගමට, මුල්ම මධ්‍ය විද්‍යාල වලින් එකක් ලබාදීම ගැන එතුමාට මහත් මහජන ප්‍රසාදයක් හිමිවිය. එතැන් පටන් සෑම වසරකම ප්‍රදේශයේ ප්‍රාථමික පාසල්වල ඉගෙනුම ලබා, පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වන සිසුන් විසි දෙනෙකුට පමණ, මධ්‍ය විදයාලයට ඇතුළත් වීමට වරම් ලැබිණ. මෙම මධ්‍ය විද්‍යාලයට ඉතාමත් ප්‍රවීණ ගුරුවරු පත්කර එවීමද ඇමතිතුමා සිරිතක් වශයෙන් කරණ ලදී.

1950 වසරේදී මටද පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්ව මතුගම සී.ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මධ්‍ය විද්‍යාලයයට ඇතුලත්වීමේ අවස්ථාව ලබාගත හැකි විය.

1957 වසරේදී අපට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට පෙනී සිටීමට නියමිත විය. දැන් අපොස සාමාන්‍ය පෙළ වෙනුවට, ඒ කාලයේ තිබුණේ˜ක යනුවෙන් නම් කර තිබුණු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයයි.

අප විභාග පන්තියේදී සිංහල සාහිත්‍ය විෂයය ඉගෙන ගත්තේ, එවකට රටෙහි ප්‍රකටව සිටි ගරුතර භික්ෂූන් වහන්සේ නමකගෙන්ය. උන්වහන්සේ, ශ්‍රී ලංකාවේ රජයේ විදුහලක ගුරු පත්වීමක් ලැබූ පළමු භික්ෂූන් වහන්සේද වූහ. සිංහල, ඉංග්‍රීසි, පාලි, සංස්කෘත යන භාෂා පිලිබඳ උසස්

නිසාම, සිංහල සාහිත්‍ය ය අපට ඉතාමත් ප්‍රියජනක විෂයයක් විය. හංස සංදේශය, දෛව යෝගය සහ එළු අත්තනගලු වංශය අපට සිංහල සාහිත්‍යය සඳහා නිර්දේශිත ග්‍රන්ථ විය. සාහිත්‍ය රසාස්වාදනයේදී මෙම පොත්වලට අමතරව තවත් විවිධ පොත් පත් වලින් කරුණු ගෙන හැර දක්වා,



සංදේශ කාව්‍ය වල දැක්වෙන දියකෙළි පවත්වන්නට ඇත්තේ මෙවැනි පොකුණුවල විය හැකිය.

නිරතුරුවම රසබර තොරතුරු රාශියක් අපට ලබාදීමට, උන්වහන්සේ සමත් වූහ.

මේ 1957 වසරයි. දෙසැම්බර් මාසයේ පැවැත්වෙන රජයේ විභාගයට තව මාසයකට වඩා නැත. හැම විෂයයකම පුනරීක්ෂණ වැඩ කරනුයේත් විභාග ප්‍රශ්න වලට ලැබේ යයි අනුමාන කළහැකි විෂයය කොටස් කෙරෙහි වැඩි අවධානයක් දැක්වීමද කරනුයේ මේ කාලයේ දීය.

අපේ පන්තියේ සිටි සියලු දෙනාම, පහේ ශිෂ්‍යත්වධාරීන්ය. මේ නිසා සියල්ලෝම එක වගේ දක්ෂයෝ වූහ. පන්තියේ සිටි ධර්මේ, සාහිත්‍ය විෂයයේ අති දක්ෂයෙක් විය. නිර්දේශිත සාහිත්‍ය පොත්වල ඇති ඕනෑම පාඨයක සම්බන්ධය දැක්වීමට, ඔහුට හැකියාවක් තිබිණ. නිර්දේශිත පොත් වලට අමතරව ගුත්තිලය, සුභාෂිතය, ලෝකෝපකාරය, සිරිත් මල්දම වැනි උසස්ම ගණයේ සාහිත්‍ය කෘති ගැනද ධර්මේට ඉතා හොඳ අවබෝධයක් තිබිණ. වාර විභාග වලදී, පන්තියේ අන් කිසිවෙකුට, සාහිත්‍යය විෂයයෙන් ඔහුට තරම් ලකුණු නොලැබුණි.

වසර අවසානයේදී, ස්වාමීන් වහන්සේ විසින් අප එකිනෙකාට, සාහිත්‍ය පුනරීක්ෂණ පැවරුම් ලෙස, මාතෘකා රාශියක් වෙන්කරදී, පොතපතින් ලබාගන්නා තොරතුරු සම්පිණ්ඩනය කර, තර්කානුකූලව, ඊට සතියකට පසු, පන්තියට ඉදිරිපත් කරණ ලෙස නියම කරන ලදී.

ධර්මේට ලැබුණේ, හංස සංදේශයේ දියකෙළි වැනුමයි.

මට ලැබුණු මාතෘකාව වුයේ දෛව යෝගය පොතෙහි, දෛවය නිසා සිදුවූයේ යයි සිතිය හැකි අවස්ථා පහක් විවේචනය කිරීමයි.

නියමිත දිනයේදී, එක් එක් ඉදිරිපත් කිරීම අවසානයේදී, ටික වේලාවක් මාතෘකාවට අදාලව කරන ලද සාකච්ඡා වලදී, බොහෝ දෙනෙකු තම අදහස්ද පළ කළ නිසා, ක්‍රියාකාරකම තව දුරටත් සාර්ථක විය. ධර්මේ මේ සෑම එකකදීම තම අදහස් ප්‍රකාශ කිරීම, හොඳින්ම කැපී පෙනුණි. කව්රුත් සාක්ච්ඡාවට සහභාගි වෙමින් ඉතා හොඳ සාහිත්‍ය රසාස්වාදයක් ලැබූහ.

මුල් ඉදිරිපත්කිරීම් කිහිපයකට පසු එළඹියේ ධර්මේගේ වාරයයි.

ධර්මේ ඔහුගේ අවස්ථාව පැමිණි විට, පන්තිය ඉදිරියට පැමිණ, හංස සංදේශයේ ඇති දියකෙළි වැණුමෙහි එන කවි කිහිපයක් තාලයට ඉදිරිපත් කළේ,

මසෙක් ගොදුරු පතා......
මෙවුලේ මිණි ගතා .......

නිල් සෙවලැයි සිතා........
සරල් වරල් ගතා .........

ආදී වශයෙනි.

එසේ කවි ඉදිරිපත් කළ ඔහු, ටික වේලාවක් නිහඬව, ස්වාමීන් වහන්සේගේ මුහුණ දෙස බලාගෙන සිටියේය.

"මොකද ධර්මයෝ.... තාලයට කවි කියවලා නිශ්ශබ්ද උනේ? කෝ විවේචන?" ස්වාමීන් වහන්සේ ඇසූහ.

තම සටහන පිටුපසට කරගත් ධර්මේ ඇඹරෙමින්.

"සමාවෙන්න...., මට දියකෙළි වැනුමේ තේරුම් ගන්නට බැරි පොඩි ගැටළුවක් තියෙනවා... හාමුදුරුවනේ....."
ධර්මේ කීවේය.

"හරි වැඩේනේ මෙතෙක් කල් නොදැක්ක ඔය ගැටලුව, මේ විභාගේ කිට්ටු වෙලාම ආවේ කොහොමද? කියනවකො බලන්න. අපි ඒක හරියට තේරුම් ගන්නට බලමු" යයි පැවසූ ස්වාමීන් වහන්සේ හරිබරි ගැසී පුටුවෙහි හිඳ ගත්හ.

තරමක් අදි මදි කළ ධර්මේ පන්තියේ වටපිට බලා, නැවත ඇඹරෙන්නට විය. මෙය කාගේත් සිනහවට කරුණක් විය. එවිට ස්වාමීන් වහන්සේ,

"මොනවද මිනිහෝ....., පන්තියේ කියන්නට බැරි දෙයක් ඕකේ නැහැනේ......., කියවනවා බලන්න කවි ටික නැවතත්....."

ඔහු කවි පෙළ පෙරටත් වඩා හොඳින් තාලයට කියවූවේය.

"කොච්චර ලස්සනට චිත්ත රූප මැවෙන කවි පෙළක්ද?.... දැන් ඉතින් මොකක්ද ඔය කවි වල නොතේරෙන දේ....., කියනවා බලන්න."

"චිත්ත රූප මැවීමේ ගැටළුවක් තමයි මටත් තියෙන්නේ ...."
"හාමුදුරුවනේ අර තුන්වෙනි කවියේ, විස්තර කරලා තියෙන මිණි මෙවුළ ගැන"
ඔහු නොතේරුණු දේ කීවේය.

"මොකක්ද, එතන තිබෙන අමාරුව...? මිණි මෙවුළ කියන්නේ මණි මේඛළාව...., පාලියෙන්. මණි මේඛළාවට තමයි සිංහලෙන් මිණි මෙවුළ කියන්නේ."

සංදේශ කාව්‍යු වල දැක්වෙන දියකෙළි පවත්වන්නට ඇත්තේ මෙවැනි පොකුණුවල විය හැකිය.

"ඒ කාලේ, රජ්ජුරුවන්ගේ අන්තඃපුර බිසෝවරු, රජ කුමරියෝ වගේ වත් පොහොසත් කාන්තාවෝ ඉනේ බඳින පළඳනාවක් ඕක...., ඔතන මණි කියන්නේ මැණික්, මේඛළාව කියන්නේ, බඳ පටිය වගේ රනින් කළ එකක්˜ඉතින් මොකක්ද ඕකේ තියෙන ගැටලුව..? ස්වාමීන් වහන්සේ නැවතත් ප්‍රශ්න කළහ.

කියම්දෝ නොකියම්දෝ යන මානසිකත්වයකින් මෙන් සිටි ධර්මේ, තරමක් පහත් ස්වරයකින්

"නැහැ හාමුදුරුවනේ....., මට නොතේරෙන්නේ..... ම් ...ම් ....ම් ...., ඔය පළඳනාව ඉනේ බඳින පටියක් නම්......, ඒක අඳින්නේ ඇඳුම් වලට උඩින්ද යටින්ද ...... කියන එකයි."

පන්තියේ පොඩි කසු කුසුවක්ද ඇසුනි.

මඳක් කල්පනා කළ ස්වාමීන් වහන්සේ .......
"ඇයි මිනිහෝ....( ඕක ඔය තරම් හිතන්න දෙයක්ද? වටිනා මැණිකක් ඇල්ලූ රත්තරන් පටියක් ඇඳුමට උඩින් මිසක් යටින් අඳින මෝඩයොත් ඉන්නවද?"

කාන්තාවෝ කොහොමටත් ඔය වටිනා ආභරණ, හොඳට ප්‍රදර්ශණය කරන්නට කැමැත්තක් තියෙනවනේ. ඒ නිසා ඕක ඇඳුමට උඩින් අඳින එකක් බව හොඳටම පැහැදිලියි නේද?

ස්වාමීන් වහන්සේගේ පිළිතුරෙන් සෑහීමට පත් වූ බවක් නොපෙන්වූ ධර්මේ යලි ටික වෙලාවක් නිශ්ශබ්දව සිට,

"එහෙනම් හාමුදුරුවනේ ඔය කාන්තාවෝ දිය නාන්නේ වටිනා ඇඳුම් පිටින්මද?" කියා ස්වාමින් වහන්සේගෙන් ප්‍රශ්න කර බිම බලාගෙන සිටිමින් , "කොහොමත් මැණික් අල්ලපු රත්තරන් පටියක් දාන්නේ......, ඒවගේ වටිනා ඇඳුම් ඇඳලා, ඒවාට පිටින් වෙන්නට ඇතිනේ?" කියා ඌණ පූරණයක්ද කළේය.

පන්තියේ කිචි, බිචිය සහ නොසන්සුන් කම තරමක් වැඩිවිය.

ස්වාමීන් වහන්සේගේ ඉවසීමේ සීමාවද ඉක්ම යමින් තිබුණු බව කාටත් දැනුණි.

19 වන පිටට